## එරාවුර් නගර සභාව

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 29 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 07 දින ඉදිරිපත් කරන ලදී . වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2012 අගෝස්තු 17 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි .

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව එරාවුර් නගර සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට එරාවුර් නගර සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

( අ ) ස්ථාවර වත්කම් ප්‍රතිසම්පාදන සංචිතය සඳහා ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබුණි .

( ආ ) සමාලෝචිත වර්ෂය අවසානයට අතැති ගබඩා තොගයන් භෞතිකව හර වැරදි බැලූ අගයට නොව පොත් අගයට දක්වා තිබුණි .

## 2 මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2 .1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.948,124 ක් වූ අතර , ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,603,116 ක් විය .

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ .

| ආදායම් විෂයය . | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම . |
|---|---|---|---|
| | රු " 000 | රු " 000 | රු " 000 |
| ( i) වරිපනම් සහ බදු | 1,961 | 2,180 | 9,688 |
| ( ii ) කල්බදු කුලී | 3,026 | 4,192 | 2,673 |
| ( iii ) බලපත්‍ර ගාස්තු | 896 | 1,011 | 1,000 |
| ( iv ) වෙනත් ආදායම් | 1,262 | 545 | 990 |

#### 2.2.2 උසාවි දඩ

පලාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා ගෙන් සහ අනෙකුත් බලධාරීන් ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ ප්‍රමාණය රු.1,481,851 ක් විය .

3 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

( අ ) ආදායම් රැස් කිරීම

( ආ ) අත්තිකාරම්

( ඇ ) ස්ථාවර වත්කම් නඩත්තුව

( ඈ ) අයවැය ලේඛණය